පොදු චක්‍රලේඛ අංක - 2022/02

මගේ අංකය:දපස/සමු.සං/සං/04/තීරක
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
147/3, ලෝඩ්ස්ගලවත්ත,
ගාල්ල.
2022.08. 31 AUG 2022

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
ගාල්ල/මාතර/හම්බන්තොට.

**සමුපකාර පනතේ 58 වන වගන්තිය යටතේ ආරවුල් බේරුම් කිරීම සඳහා බේරුම්කරුවන් පත් කිරීම හා තීරක ගාස්තු ගෙවීම.**

යථෝක්ත කාරණය සම්බන්ධයෙන් මීට පෙර මවිසින් නිකුත් කර ඇති 2008.03.26 දිනැති අංක 2008/03 දරණ චක්‍රලේඛය, 2012.11.14 දිනැති අංක 2012/03 දරණ චක්‍රලේඛය, 2013.02.18 දිනැති අංක 2013/01 දරණ චක්‍රලේඛය, 2013.10.14 දිනැති අංක 2013/03 දරණ චක්‍රලේඛය 2018.09.05 දිනැති අංක 2018/04 දරණ චක්‍රලේඛය 2019.09.30 දිනැති 2019/02 චක්‍රලේඛයන් මින් අවලංගු කරමි.

2. ආරවුලේ වටිනාකම නොසලකා එක් ණය ආරවුලක් සඳහා තීරක ගාස්තුව රු.2,000/- ක් සහ ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු රු.2,200/- ක්ද වශයෙන් එක් ණය ආරවුලක් සඳහා තැන්පත් කලයුතු මුළු තීරක ගාස්තුව රුපියල් 4,200/- ක් වේ. මේ වන විට සහකාර කොමසාරිස් කාර්යාල වෙත ලැබී ඇති විභාග වී අවසන් නොවූ ණය ආරවුල් සඳහා වැඩිවන ලද තැපැල් වියදම පමණක් අදාල සමිතිවලින් ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුය.

3. විවිධ ආරවුල් සඳහා තීරක ගාස්තු මෙසේය.

| | තීරක ගාස්තු රු. | ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු රු | එකතුව රු. |
|---|---|---|---|
| රු.5,000/- දක්වා | 3,000/- | 1,000/- | 4,000/- |
| රු.5,001/- සිට රු.10,000/- දක්වා | 5,000/- | 1,500/- | 6,500/- |
| රු.10,001/- සිට 25,000/- දක්වා | 7,500/- | 2,000/- | 9,500/- |
| රු.25,001/- සිට 100,000/- දක්වා | 12,000/- | 2,000/- | 14,000/- |
| රු.100,001/- සිට 250,000/- දක්වා | 15,000/- | 2,500/- | 17,500/- |
| රු.250,001/- සිට 500,000/- දක්වා | 30,000/- | 2,500/- | 32,500/- |
| රු.500,001/- සිට 2,000,000/- දක්වා | 40,000/- | 4,000/- | 44,000/- |
| රු.2,000,001/- සිට 3,000,000/- දක්වා | 45,000/- | 5,000/- | 50,000/- |
| රු.3,000,001/- සිට 5,000,000/- දක්වා | 50,000/- | 5,500/- | 55,500/- |
| රු.5,000,001/- ට වැඩි | 65,000/- | 6,000/- | 71,000/- |

4. සංශෝධිත ගාස්තු 2022.08.30 දින සිට ක්‍රියාත්මක වේ. මෙම චක්‍රලේඛය බල පැවැත්වෙන දිනය වන විට තීරක ප්‍රදාන ලබාදී නොමැති ආරවුල් සඳහාද ප්‍රමාණවත් කරුණු මා වෙත ඉදිරිපත් කර සංශෝධිත ගාස්තු ඉදිරිපත් කිරීමට තීරකවරුන්ට හැකියාව ඇත. එම අවස්ථාවලදී එම ගාස්තු තැන්පත් කිරීමට සමිතිය වෙත උපදෙස් ලබාදිය යුතුවේ.

5. ආරවුල් බේරුම් කිරීම සඳහා නිලධාරීන් පත් කිරීමේදී පහත සඳහන් උපදෙස් පරිදි ක්‍රියා කළයුතු වේ.

I. සියළුම ණය ආරවුල් බේරුම් කිරීම සඳහා බේරුම්කරුවන් පත් කිරීමේදී පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සමුපකාර සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමු පෙළ විභාගය සමත්ව අවුරුදු පහක සේවා කාලයක් සම්පූර්ණ නිලධාරීන් පත් කිරීම.

II. විවිධ ආරවුල් යොමු කිරීමේදී පහත සඳහන් සුදුසුකම් ඇති අය පත් කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වන අතර, රු.2,000,000/- දක්වා වටිනාකමකින් යුක්ත ආරවුල් සඳහා බේරුම්කරුවන් පත් කිරීමේදී එම දිස්ත්‍රික්කයේ රාජකාරියේ නියුතු නිලධාරීන් පත් කිරීමට කටයුතු කළ හැකිය.

| | |
|---|---|
| රු.5,000/- දක්වා ආරවුල් | පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සමුපකාර සංවර්ධන නිළධාරීන් සඳහා වන පළමු පෙළ විභාගය සමත්ව අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කළ ස.සං.නි. ii ශ්‍රේණියේ නිළධාරීන් |
| රු.5,001/- සිට රු.50,000/- දක්වා ආරවුල් | ස.සං.නි.ii ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |
| රු.50,001/-සිට රු.100,000/- දක්වා ආරවුල් | ස.සං.නි.ii ශ්‍රේණියේ වසර 07 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |
| රු.100,001/-සිට රු.250,000/- දක්වා ආරවුල් | ස.සං.නි.i ශ්‍රේණියේ නිළධාරීන් |
| රු.250,001/- සිට රු.2,000,000/- දක්වා ආරවුල් | ස.සං.නි.i ශ්‍රේණියේ වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |
| රු.2,000,001/- සිට රු.5,000,000/- දක්වා ආරවුල් | ස.සං.නි.i ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |
| රු.5,000,001/- ට වැඩි ආරවුල් | ස.සං.නි.i ශ්‍රේණියේ වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |

6. ණය ආරවුල් යොමු කිරිමේදී එකවර ආරවුල් 10ක උපරිමයකට යටත්ව ආරවුල් භාරදිය යුතු අතර, එම ආරවුල් විභාග කර වාර්තා භාරදීමෙන් පසු නැවත ආරවුල් යොමුකල යුතුය. එක් එක් දිස්ත්‍රික්කයේ පවතින ණය ආරවුල් සංඛ්‍යාව අනුව නිළධාරියාට දෙන ආරවුල් ප්‍රමාණය 10 සිට 20 දක්වා වැඩි කිරීමට වාර්ෂිකව මාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව සිදු කල හැකිය.

7. බේරුම් කිරීම සඳහා බේරුම්කරුවන් වෙත භාරදෙන ලද ආරවුල් මාස තුනක් ගතවීමට පෙර විභාග කොට බේරුම් කර නැවත භාරදිය යුතුය. කාලය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය වුවහොත් එසේ කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය වන හේතු සඳහන් කර ඉදිරිපත් වන ඉල්ලීම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදිය යුතුය.

8. ලක්ෂ පනහට වැඩි ආරවුල් සඳහා බේරුම්කරුවන් හෝ බේරුම්කාර මණ්ඩලයක් පත් කිරීමට මා වෙත ඉදිරිපත් කල යුතුය. එසේම බේරුම්කාර මණ්ඩලයක් පත්කිරීම රීති මාලාවේ විධිවිධාන අනුව සිදු කලයුතු අතර බේරුම්කාර මණ්ඩලයේ තීරක ගාස්තු ගෙවීම සම්බන්ධව මා විසින් නියම කරනු ඇත.

ටී.ජී.සරත් කුමාර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
දකුණු පළාත.

පිටපත්:

1. සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් - දැ.පි.
2. ගණකාධිකාරී - දැ.පි.
3. දකුණු පළාතේ සියළුම සමුපකාර සමිතිවල ගරු සභාපතිවරුන් වෙත - දැ.පි.